**<u>ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය- 2012</u>**

**1 මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ (ජා ජ ස ජ ම) මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

**1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී ලං ගි ප්‍ර)**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලං ගි ප්‍ර 16 - දේපල, පිරියත හා උපකරණ (PPE)

මණ්ඩලයේ මෝටර් වාහන, ගොඩනැගිලි හා යටිතල පහසුකම් මූල්‍ය ප්‍රකාශනවල සාධාරණ අගයට ඉදිරිපත් කළ යුතු වුවත්, මණ්ඩලයේ උතුරු මැද හා දකුණු ප්‍රාදේශීය කාර්යාලවලට අයත් එම වත්කම්වලින් සමහරක් මූල්‍ය ප්‍රකාශනවල සාධාරණ අගයට ගිණුම් ගතකර නොතිබුණි.

(ආ) ශ්‍රී ලං ගි ප්‍ර 20 - රජයේ ප්‍රදාන ගිණුම්ගත කිරීම හා රජයේ ආධාර හෙළිදරව් කිරීම

වෙළඳ පොළ අනුපාතයට වඩා අඩුවෙන් වූ පොලී අනුපාතයකට ලබාදෙන ලද රජයේ ණය පිළිබඳ ප්‍රතිලාභ මූල්‍ය ප්‍රකාශනවල රජයේ ප්‍රදාන ලෙස සලකා නොතිබුණි.

1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දේපල, පිරියත හා උපකරණ පිළිබඳ ප්‍රාග්ධනිත කිරීමේ නිර්නායකයන් සැලකීමෙන් තොරව 2011 ජනවාරි 01 දිනට, 2011 දෙසැම්බර් 31 දිනට හා 2012 දෙසැම්බර් 31 දිනට පිළිවෙලින් රු.394,530,751 ක්, රු.610,325,081 ක් හා රු.698,216,120 ක් වූ වාහන අමතර කොටස්, ජල පොම්ප හා පොම්ප අමතර කොටස් වලට අදාළ තොග ප්‍රාග්ධනිත කර තිබුණි.

තවද, සමාලෝචිත වර්ෂය තුළ ප්‍රාග්ධනිත කරන ලද පොම්ප, නල හා අමතර කොටස් රු.698,216,120 ක් වූ අතර භෞතිකව සත්‍යාපනය කරන ලද ශේෂය රු.690,530,690 ක් විය. එබැවින් 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ දේපල, පිරියත හා උපකරණ රු.7,685,429 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) 2012 වර්ෂය සඳහා පාරිභෝගිකයන් විසින් ඔවුන්ගේ මාසික ජල බිල්පත් නිරවුල් කිරීමේදී ඔවුන්ට දෙන ලද මුළු වට්ටම් ප්‍රමාණය රු.214,352,013 ක් මුදල් වට්ටම් ලෙස සලකනු වෙනුවට සමාලෝචිත වර්ෂය සඳහා ආදායමෙන් අඩු කර දක්වා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ දැක්වෙන දළ ආදායම එම මුදලින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) ජාත්‍යන්තර සහයෝගීතාවය සඳහා වූ ජපන් බැංකුව (JBIC ) විසින් මූල්‍යයනය කරන ලද ආදායම් නොලබන ජලය ව්‍යාපෘතිය (එස්එල්පී - 66) සාර්ථක නොවූ අතර එබැවින් ව්‍යාපෘතිය පසුව අවලංගු කර තිබුණි. කෙසේ වුවද ව්‍යාපෘතිය අවලංගු කිරීම දක්වා ඒකාබද්ධ අරමුදලින් දරන ලද රු. මිලියන 354.7 ක මුදලක් හා වැඩිබිම් සකස් කිරීම, පඩිනඩි, පරිපාලන වියදම් හා උපදේශක සේවා සඳහා ගෙවීම් ආදියට අදාළ ණය, මණ්ඩලයට සිදු වූ පාඩුවක් ලෙස සැලකීමෙන් තොරව කළු ගඟ ව්‍යාපෘතියේ හා මහ කොළඹ පුනරුත්ථාපන ව්‍යාපෘතිවල කෙරීගෙන යන වැඩවලට මාරුකර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය සඳහා කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ පිළිබඳ තථ්‍ය මුදල් සංචලනයන් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙන් නිරූපණය වී නොතිබුණු අතර එම ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂය අතර රු.10,030,554,746 ක් වූ වෙනස මුදල් පිටතට ගලායාමක් ලෙස හඳුනාගෙන තිබුණි. අවශ්‍ය විධිමත් වාර්තා පවත්වා නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ වැය කරන ලද තථ්‍ය මුදල විගණනයේදී තහවුරු කළ නොහැකි විය.

(ඉ) සමාලෝචිත වර්ෂය තුළ දේපල, පිරියත හා උපකරණ අත්කර ගැනීම් වලට අදාළව තථ්‍ය මුදල් ගලායාම හඳුනා ගැනීමෙන් තොරව විගණනයේදී පිළිගත නොහැකි සමහර ගැලපීම් සිදු කිරීමෙන් පසුව වටිනාකම තහවුරු කර ගැනීම මගින් රු.26,099,213,596 ක මුදලක් මුදල් ගලායාමක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශනයට ගෙන තිබුණි.

(ඊ) එකතුව රු.31,967,414 ක් වූ බැරකම් ගිණුම්වල හර ශේෂයන්, එකතුව රු.20,669,180 ක් වූ වත්කම් ගිණුම්වල බැර ශේෂයන් හා රු.10,214,620 ක් වූ වියදම් ගිණුම්වල බැර ශේෂයන් මූල්‍ය ප්‍රකාශනවල අසාමාන්‍ය ලෙස දැක්වෙන අතර, එය සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵල හා මූල්‍ය තත්ත්වය විකෘති කර තිබුණි.

(උ) 2011 වර්ෂයේදී වාහන 8 ක් අපහරණය කිරීමෙන් ලැබුණු රු.2,947,140 ක් වූ මුදල් එම වර්ෂය සඳහා ගිණුම් ගත කර තිබුණි. කෙසේ වුවද එම වාහනවල පිරිවැය හා සමුච්චිත ක්ෂය සමාලෝචිත වර්ෂයේ අපහරණ ගිණුමට සටහන් කිරීමෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන හා පෙර වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය ප්‍රතිඵල පිළිවෙලින් රු.3,783,340 කින් වැඩියෙන් හා අඩුවෙන් දක්වා තිබුණි.

(ඌ) වත්කම් අපහරණය කිරීමෙන් වූ රු.3,050,766 ක පාඩුව සමාලෝචිත වර්ෂයේ ආදායමට එරෙහිව අයකරනු වෙනුවට හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ දැක්වෙන රඳවාගත් ලාභවලින් අඩුකර තිබුණි. එබැවින් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ දැක්වෙන ශුද්ධ ලාභය එම මුදලින් වැඩියෙන් දක්වා තිබුණි.

(එ) 2012 වර්ෂයේදී හක්මණ ගබඩාවට ලැබුණු රු.5,337,718 ක් වූ තොග මූල්‍ය ප්‍රකාශනවල මාර්ගස්ථ බඩු ලෙස වර්ගීකරණය කර තිබුණි. මේ අතර 2012 වර්ෂයට පෙර නිම කරන ලද විදේශ මූල්‍යයන ව්‍යාපෘති 4 ක් විසින් මණ්ඩලයට භාරදෙන ලද රු.29,836,125 ක් වූ තොගය, තොග ලෙජරයට ගිණුම්ගත කර නොතිබුණි. ඊට අමතරව, වෙනත් විදේශ මූල්‍යයන ව්‍යාපෘති කිහිපයක් විසින් භාර දෙන ලද තොග විෂයයන් 889 ක්ද අගය කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඒ) රු.1,025,553,690 ක් වූ නිමකර භාරදෙන ලද ජල සම්පාදන ව්‍යාපෘති 36 ක පිරිවැය ප්‍රාග්ධනිත කිරීමෙන් තොරව 2012 දෙසැම්බර් 31 දිනට කෙරීගෙන යන වැඩ ගිණුමේ පැවතුණි. තවද ඉන් රු.316,309,795 ක් පිරිවැය වූ ව්‍යාපෘති 10 ක් වර්ෂ 6 කට පෙර නිමකරන ලද ව්‍යාපෘති විය.

( ඔ) මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය ගැලපීම් සිදු කිරීම සඳහා විමර්ශනය කිරීමෙන් තොරව රු.935,920,720 ක් වූ කෙරීගෙන යන වැඩ ගිණුමේ ශේෂය, වර්ෂ 2 සිට 7 දක්වා කාලයක් වෙනස් නොවී එසේම පැවතුණි.

(ඕ) රු.130,657,409 කට මණ්ඩලය විසින් භාරගන්නා ලද බාහිර ව්‍යාපෘති 3 ක් නිම කර තිබූ අතර 2012 දෙසැම්බර් 31 දින අදාළ පාර්ශවයන්ට භාර දී තිබුණි. එසේ වුවද 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන කෙරීගෙන යන වැඩ ගිණුමේ එය එසේම පැවතුණි.

(ක) මඩකලපුව ප්‍රාදේශීය කාර්යාලයේ ගබඩා 4 ක භෞතික තොග සත්‍යාපන ශේෂ ගිණුම්වලට ගැනීම වෙනුවට ලෙජර් ශේෂය ගිණුම්වලට ගැනීම හේතුවෙන් 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ඉන්වෙන්ට්‍රි ශේෂ රු.16,165,505 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(කා) මොණරාගල ප්‍රාදේශීය කාර්යාලයේ ගබඩාවෙන් බණ්ඩාරවෙල ප්‍රාදේශීය කාර්යාල ගබඩාවට මාරු කරන ලද රු.2,088,107 ක් වටිනා තොග බණ්ඩාරවෙල ප්‍රාදේශීය කාර්යාලයේ තොග ගිණුමට (202) සටහන් කරනු වෙනුවට තොග ගැලපීම් ගිණුමට (476) සටහන් කර තිබුණි.

(කැ) අවිනිශ්චිත ගිණුමේ රු.3,429,965 ක් හා රු. 956,115 ක් වූ පිළිවෙලින් හර හා බැර ශේෂ නිරවුල් කිරීමෙන් තොරව දීර්ඝ කාලයක සිට වර්ෂයෙන් වර්ෂය මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙන එමින් තිබුණි.

(කෑ) 2009 වර්ෂයේ සිට වවුනියා ප්‍රාදේශීය කාර්යාලයේ ගබඩාවල තිබූ රු.66,349,388 ක් වටිනා දේපල, පිරියත හා උපකරණ, දේපල,පිරියත හා උපකරණ ගිණුමට මාරුකර 2012 වර්ෂයේදී ප්‍රත්‍යාගණනය කර තිබුණි. කෙසේ වුවද, මෙම දේපල පිරියත හා උපකරණ සඳහා 2009 වර්ෂයේ සිට කිසිදු ක්ෂය ප්‍රතිපාදනයක් මූල්‍ය ප්‍රකාශනවල සිදු කර නොතිබුණි.

මේ සම්බන්ධයෙන් මණ්ඩලයේ සභාපති විසින් පහත පරිදි සඳහන් කර තිබුණි.

" වත්කම් භාවිතයේ තිබුණද, ඉකුත් වර්ෂවල උතුරේ පැවති අවිනිශ්චිත තත්ත්වයන් හේතුවෙන් ඒවා භාවිතා කළ අයට ලිඛිතව නිකුත් නොකරන ලදී. එබැවින් අදාළ වත්කම්වල ක්ෂය ඇස්තමේන්තු කිරීම අප හට කළ නොහැකි විය."

(කි) 2011 වර්ෂයේදී ප්‍රත්‍යාගණනය කරන ලද වත්කම් සම්බන්ධයෙන් රු.254,176,756 ක සමුච්චිත ක්ෂය එම වර්ෂයේ ප්‍රත්‍යාගණන ගිණුමට මාරු කර නොතිබුණි. කෙසේ වුවද හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ දැක්වෙන ඉදිරියට ගෙන එනු ලැබූ රඳවාගත් ඉපැයීම්වලින් 2012 වර්ෂය සඳහා රු.33,962,411 ක් වූ ක්ෂය සමඟ එය අඩු කර තිබුණි.  එහි ප්‍රතිඵලයක් ලෙස සමාලෝචිත වර්ෂයේ ලාභය රු.33,962,411 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(කී) 2012 වර්ෂයේ පරිපාලන වියදම්වලට මාරු කරන ලද රු.776,836,147 ක ප්‍රත්‍යාගණන පාඩුවට පෙර වර්ෂයේ රු.16,087,247 ක ප්‍රත්‍යාගණන පාඩුවද ඇතුළත් කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශුද්ධ ලාභය රු.16,087,247 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(කු) යටියන්තොට ජල සම්පාදන යෝජනා ක්‍රමයට අයත් ඉඩමෙහි වටිනාකම සාවද්‍යව රු.26,400,000 ක් ලෙස ගිණුම් ගත කර තිබූ නමුත් එහි තථ්‍ය පිරිවැය රු.2,640,000 ක් විය. එබැවින් සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන දේපල පිරියත හා උපකරණ රු.23,760,000 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(කූ) 2002 වර්ෂයේ සිට වර්ෂ 10 ක කාලයකට කල්බදු පදනම මත මණ්ඩලය විසින් පුද්ගලික සමාගමකින් ලබාගන්නා ලද අඹතලේ ජල පිරිසිදු කිරීම් පිරියතහි වත්කම් ද රු. 48,276,000 ක් ලෙස ප්‍රත්‍යාගණනය කර තිබූ අතර එය මණ්ඩලයේ වත්කම් ගිණුම්වලට ගිණුම්ගත කර තිබුණි. 2012 සැප්තැම්බර් 30 දිනට වත්කම්වල කල් බදු කාල පරිච්ඡේදය ඉකුත් වී තිබුණද, ගැලපීම් කිරීමෙන් තොරව එම වත්කම් මණ්ඩලයේ ගිණුම්වල පැවතුණි.

(කෙ) ආසියානු සංවර්ධන බැංකුව විසින් මූල්‍යායනය කෙරෙන යාපනය කිලිනොච්චි ජල සම්පාදන ව්‍යාපෘතිය සඳහා මහා භාණ්ඩාගාරය විසින් ලබා දී තිබූ උප ණය මුදල සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර නොතිබුණි. 2012 දෙසැම්බර් 31 දිනට ණය ශේෂය රු.136,873,431 ක් විය.

(කේ) 2009 වර්ෂයේදී විසල් ත්‍රිකුණාමලය ජල සම්පාදන ව්‍යාපෘතිය සඳහා ප්‍රංශ රජය හා ප්‍රංශ සංවර්ධන නියෝජිතායතනය විසින් ලබා  දී තිබූ විදේශාධාර රු.133,722,026 ක් විය. මහා භාණ්ඩාගාරය විසින් ඉන් භාගයක් ප්‍රදානයක් ලෙස හා ඉතිරි භාගය උප - ණය මුදලක් ලෙස සලකා තිබුණි. කෙසේ වුවද මණ්ඩලය විසින් සම්පූර්ණ මුදලම

2009 වර්ෂයේදී ණයක් ලෙස ගිණුම්ගත කර තිබුණු අතර එම දෝෂය 2012 වර්ෂයේදී නිවැරදි කර තිබුණි. එහෙත්, සම්පූර්ණ මුදල සඳහා ගිණුම්ගත කරනු ලැබූ පොලිය නිවැරදි කර නොතිබූ බැවින් සමාලෝචිත වර්ෂය සඳහා ශුද්ධ ලාභය සහ 2012 ජනවාරි 01 දිනට රඳවාගත් ලාභ පිළිවෙලින් රු.4,011,661 කින් හා රු.8,028,322 කින් අඩුවෙන් දක්වා තිබුණු අතර 2012 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ශේෂය රු.12,034,982 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(කො) වියළි කලාපීය නාගරික ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය සඳහා ලබාගත් ආසියානු සංවර්ධන බැංකු ණය සම්බන්ධයෙන් 2010,2011 හා 2012 වර්ෂ සඳහා පොලිය පිළිවෙළින් රු.229,355 ක්, රු.333,845 ක් හා රු.4,495,834 ක් ගිණුම්ගත කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන කෙරීගෙන යන වැඩ හා උපචිත වියදම් රු.5,059,034 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(කෝ) 2012 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන අනුව, 2012 දෙසැම්බර් 31 දිනට විදේශ ප්‍රදාන ගිණුමේ ශේෂය රු.115,885,741,431 ක් වූ අතර ඒ සම්බන්ධයෙන් පහත දැක්වෙන අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) ඉහත දැක්වෙන ශේෂයෙන් ගිණුම් 48 කට අදාළව එකතුව රු.15,510,711,286 ක මුදලක් හෙවත් සියයට 13 ක් 2012 දෙසැම්බර් 31 දිනට ක්‍රමක්ෂය කිරීමෙන් තොරව වර්ෂ 3 සිට 7 කට වැඩි කාලයක් නොවෙනස්ව පැවතුණි. එම විදේශීය ප්‍රදානවලට අදාළ වත්කම් පිළිබඳ විස්තර නොමැති වීම හේතුවෙන් ක්‍රමක්ෂය නොකිරීම නිසා මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම විගණනයේදී තහවුරු කළ නොහැකි විය.

(ii) නෝරාඩ් ව්‍යාපෘති 3 කට අදාළව විදේශීය ප්‍රදාන වැඩියෙන් ක්‍රමක්ෂය කිරීම හේතුවෙන් එම ශේෂය තුළ රු. 3,257,197 ක අසාමාන්‍ය හර ශේෂයක් නිරීක්ෂණය විය.

(iii) රු.5,940,582 ක් වූ පාරිතෝෂික ගෙවීමද එහි ඇතුළත් කර තිබුණි.

(iv) විශේෂිතව ව්‍යාපෘතියට / වලට වෙන්කළ නොහැකි විදේශ ප්‍රදාන ගිණුම් අංක 00/0/00/365/0 ට සටහන් කරන ලද එකතුව රු.2,451,558,287 ක් වූ ගනුදෙනු 2012 දෙසැම්බර් 31 දිනට ක්‍රමක්ෂය කර නොතිබුණි.

(v) යුනිසෙෆ් හා රතුකුරුස සංවිධානයන් විසින් තිරුක්කෝවිල් හා පොතුවිල් ප්‍රදේශීය සහාය මධ්‍යස්ථානවලට පරිත්‍යාග කරන ලද වත්කම්වල මුළු වටිනාකම රු.1,252,656,322 ක් විය. කෙසේවුවද ක්‍රමක්ෂය කිරීම සඳහා හේතු නොවූ එය අදාළ ප්‍රදානවලට සටහන් කිරීමෙන් තොරව ප්‍රධාන කාර්යාලයේ ප්‍රදාන ගිණුමට (ගිණුම් අංක 00/0/00/365/0) මාරු කර තිබුණි.

(ග) ණය පදනම මත ලබා දෙන ලද නව ජල සැපයුම් සම්බන්ධතා ගිණුම්ගත කර නොතිබුණි. ඒ වෙනුවට මාසික ජල බිල් පත් මගින් 2012 වර්ෂයේදී අය කරගත් නව සම්බන්ධතා ගාස්තු වාරික රු.17,138,893 ක් නව සම්බන්ධතා ණයගැති වාරික පාලන ගිණුමට පමණක් බැරකර තිබුණි.

(ගා) ජල සම්පාදන යෝජනාක්‍රම සඳහා ශ්‍රී ලංකා රජය විසින් ලබාගෙන ඇති රු.10,458,797,332 ක් වූ විදේශ ණය 11 ක් සඳහා මහා භාණ්ඩාගාරය සමඟ උප ණය ගිවිසුම්වලට එළඹී නොතිබුණු අතර එහි ප්‍රතිඵලයක් ලෙස ණය කොටස හා ප්‍රදාන කොටස විගණනයේදී වෙනම හඳුනාගත නොහැකි විය. කෙසේ වුවද මහා භාණ්ඩාගාරයෙන් නිශ්කාෂණයක් ලබා ගැනීමෙන් තොරව සම්පූර්ණ මුදලම මූල්‍ය ප්‍රකාශනවල ව්‍යාපෘති ණය ලෙස ගිණුම්ගත කර තිබුණි. රු.7,832,854,966 ක් වූ විදේශ ණය හයකට අදාළව සමාලෝචිත වර්ෂය සඳහා රු. 693,633,943 ක් වූ ණය පොලිය පමණක් ගිණුම්ගත කර තිබුණද, ගිණුම්ගත කිරීම සඳහා පදනම විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ගැ) 2012 දෙසැම්බර් 31 දිනට ප්‍රාදේශීය සහාය මධ්‍යස්ථානයේ (බස්නාහිර උතුර) පැවති රු.16,057,633 ක් වටිනා වත්කම් විෂයයන් 15 ක් මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

(ගී) රු.2,764,160 ක් වූ ප්‍රාදේශීය සහාය මධ්‍යස්ථානයේ (බස්නාහිර උතුර) ඉවත් කරන ලද ගොඩනැගිලිවල ශුද්ධ පොත් අගය ගිණුම්වල පැවති බැවින් 2012 දෙසැම්බර් 31

දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන දේපල, පිරියත හා උපකරණ අගය එම මුදලින් වැඩියෙන් දක්වා තිබුණි.

(ගු) 2012 වර්ෂයේදී ලියා හරින ලද රු.41,293,375 ක් වූ මලාපවහන ණයගැති ශේෂය සමාලෝචිත වර්ෂයේ ලාභයට එරෙහිව අය කිරීමෙන් තොරව 2012 වර්ෂයේ රඳවාගත් ඉපැයීම් ආරම්භක ශේෂයට ගලපා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස සමාලෝචිත වර්ෂය සඳහා ලාභය එම මුදලින් අඩුවෙන් දක්වා තිබුණි.

(ගෙ) එකතුව රු.81,497,789 ක් වූ නෝර්වීජියානු රජය හා ශ්‍රී ලංකා රජය (ශ්‍රී ලං ර) විසින් මූල්‍යායනය කරන ලද නෝරාඩ් ව්‍යාපෘතියේ සමස්ත කෙරීගෙන යන වැඩ ශේෂය, එක් එක් ප්‍රභවය විසින් දරන ලද තථ්‍ය මුදල හඳුනාගැනීමෙන් තොරව, ශ්‍රී ලංකා රජයට අදාළව ඉදිරියට ගෙන එන ලද ශේෂයට එරෙහිව හිලව් කර තිබුණි.

(ගො) මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන මොරටුව/ රත්මලාන, ඒකල/ ජා ඇල අප ජලය අපහරණය කිරීමේ ව්‍යාපෘතියේ හා විසල් ත්‍රිකුණාමලය ජල සම්පාදන ව්‍යාපෘතියේ 2012 දෙසැම්බර් 31 දිනට කෙරීගෙන යන වැඩ ශේෂ සාවද්‍ය සටහන් කිරීම් හා එම ශේෂ ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් පිළිවෙලින් රු.22,193,932 කින් හා රු.698,523,622 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ගෝ) මූල්‍ය ප්‍රකාශනවල තැන්පතු හා අත්තිකාරම් යටතේ දැක්වෙන රු.47,565,589 ක් වූ යළි අයකිරීමේ වැඩ (rechargeable Works ) වලට අදාළව දරන ලද ඉදිකිරීම් පිරිවැය පිළිබඳ ලැබිය යුතු ශේෂය තුළ රු.1,952,428 ක බැර ශේෂයක්ද ඇතුළත්ව තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ලැබිය යුතු ශේෂය එම මුදලින් අඩුවෙන් දක්වා තිබුණි. එම හිඟ ශේෂය අදාළ ගනුදෙනුකරු අත්තිකාරම්වලට එරෙහිව හිලව් කිරීමට කටයුතු කර නොතිබූ බව තවදුරටත් නිරීක්ෂණය විය.

(ච) ගිණුම්කරණ දෝෂයක් හේතුවෙන් 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.298,983,431 ක් වූ එකතු කළ අගය මත බදු බැරකම රු.14,933,814 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ජ) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන විසල් ත්‍රිකුණාමලය ජල සම්පාදන ව්‍යාපෘතියේ හා වියළි කලාපීය නාගරික ජල සැපයුම් හා සනීපාරක්ෂක ව්‍යාපෘතියේ (ආ ස බැ 5 වැනි ව්‍යාපෘතිය) ණය ශේෂයන් ගිණුම්කරණ දෝෂ හේතුවෙන් පිළිවෙලින් රු.18,023,250 කින් හා රු.3,612,041 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඣ) 2012 දෙසැම්බර් 31 දිනට සැසඳිය යුතුව පැවති හඳුනා නොගත් හා නොසැසඳූ දිගුකාලීන හිඟ හර හා බැර ශේෂයන් පිළිවෙලින් රු.236,388,280 ක් හා රු.190,607,762 ක් විය.
අක්‍රිය ලෙස දැනටමත් වර්ගීකරණය කරන ලද ඉහත කී ශේෂයන්ට අමතරව 2012 දෙසැම්බර් 31 දිනට එකතුව රු.79,755,636 ක් වූ වෙනත් හඳුනා නොගත් ශේෂයන් කිහිපයක් ද පැවතුණි.

(ත) 2000 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙන එන ලද ගෙවිය යුතු වැටුප් හා වේතන ගිණුමේ අක්‍රිය ශේෂය රු.36,876,515 ක් විය. කෙසේ වුවද 2001 හා 2002 වර්ෂ සඳහා ගෙවිය යුතු වැටුප් හා වේතන සම්බන්ධයෙන් 2012 වර්ෂයේදී අනාවරණය වූ රු.8,802,907 ක් වූ දෝෂය නිවැරදි කිරීම සඳහා ඉහත සඳහන් ගිණුම් ශේෂයට එරෙහිව සාවද්‍යව හිලව් කර තිබුණි.

(ද) 2012 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන සුබ සාධක අරමුදලේ ශේෂය, බැංකු ඉතිරිකිරීමේ ගිණුමේ අදාළ ආයෝජන ශේෂය සමඟ සැසඳීමේදී රු.5,132,338 කින් අඩුවෙන් දක්වා තිබුණි.
2012 දෙසැම්බර් 31 දිනට සුබ සාධක අරමුදල් ගිණුමේ රු.14,415,579 ක ශේෂයක් දක්වා තිබුණද, සුබ සාධක අරමුදල පිහිටුවීම, අරමුණ, බලය, ක්‍රියාත්මක කිරීම, අරමුදල් යෙදවීම,කළමනාකරණය ආදී විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. තවද 2011 හා 2012 වර්ෂවල වාර්ෂික ලාභයෙන් එයට මාරු කරන ලද පිළිවෙලින් රු.467,305 ට සහ රු.480,002 ට අමතරව මණ්ඩලය විසින් උපයනු ලබන උපදේශක සේවා ආදායමෙන් සියයට 20 ක්ද එම ගිණුමට වාර්ෂිකව මාරු කර තිබුණි.

### 1.2.3 නොසැසඳු වෙනස්කම්

-----------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) යාපනය කිලිනොච්චි ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතියේ, වියළි කලාපීය ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතියේ සහ කළු ගඟ ව්‍යාපෘතියේ එක් එක් මූල්‍ය ප්‍රකාශනවල 2012 දෙසැම්බර් 31 දිනට දැක්වෙන කෙරීගෙන යන වැඩ ශේෂ පිළිවෙලින් රු.194,563,838 ක්, රු.1,351,366,762 ක් හා රු.5,015,235,578 ක් විය. කෙසේ වුවද, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව එම ශේෂ පිළිවෙලින් රු.22,359,036 ක්, රු.1,278,682,523 ක් හා රු.5,055,105,357 ක් විය. එබැවින් එම මූල්‍ය ප්‍රකාශන යුගල අතර නිරීක්ෂණය වූ නොසැසඳු ශේෂ පිළිවෙලින් රු.172,204,802 ක් , රු.72,684,239 ක් හා රු.20,130,221 ක් විය.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනට වෙළඳ හා මලාපවහන ණයගැති ශේෂය රු.3,687,794,673 ක් විය. එහෙත් මණ්ඩලයේ වාණිජ අංශය විසින් විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, එය රු.3,613,555,000 ක් විය. එබැවින් එම ශේෂ අතර නිරීක්ෂණය වූ නොසැසඳු වෙනස රු.74,239,673 ක් විය.

(ඇ) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන සමාලෝචිත වර්ෂය සඳහා ජලය විකුණුම් වලින් ආදායම වාණිජ අංශයේ දැක්වෙන සංඛ්‍යා සමඟ එකඟ නොවූ අතර ඒ දෙක අතර නිරීක්ෂණය වූ රු.182,055,961 ක වෙනස පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ප්‍රාදේශීය සහාය මධ්‍යස්ථානය | මූල්‍ය ප්‍රකාශන අනුව මුදල | වාණිජ අංශයේ වාර්තා අනුව මුදල (බිල් ගැලපීමෙන් පසුව) | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| බස්නාහිර මධ්‍යම | 5,656,414,679 | 5,677,953,229 | 21,538,550 |
| බස්නාහිර දකුණ | 1,381,418,942 | 1,389,410,053 | 7,991,111 |
| බස්නාහිර උතුර | 1,500,716,852 | 1,493,688,519 | 7,028,333 |
| දකුණ | 1,404,893,194 | 1,447,501,728 | 42,608,534 |
| මධ්‍යම | 1,071,320,710 | 1,068,203,950 | 3,116,760 |
| නැගෙනහිර | 575,096,948 | 568,032,064 | 7,064,884 |
| උතුරු මැද | 564,886,271 | 559,256,085 | 5,630,186 |
| වයඹ | 307,785,682 | 268,906,514 | 38,879,168 |
| සබරගමුව | 448,837,880 | 471,442,261 | 22,604,381 |
| උතුර | 45,026,791 | 21,172,845 | 23,853,946 |
| ඌව | 390,199,400 | 388,459,292 | 1,740,108 |
| එකතුව | | | 182,055,961 |

(ඈ) අලුතින් හඳුන්වා දෙන ලද පරිගණකගත ඉන්වෙන්ට්‍රි කළමනාකරණ පද්ධතිය මගින් ප්‍රමාණවත් තොරතුරු උත්පාදනය කිරීමට නොහැකි වීම හේතුවෙන් ප්‍රධාන ගබඩාවේ පිත්තල (Braze) විෂයයන් සම්බන්ධයෙන් තොග ලෙජර ශේෂය හා පරිගණක ගත ඉන්වෙන්ට්‍රි පද්ධතියේ ශේෂය අතර රු.13,715,992 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 1.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.මිලියන 840 ක් වූ වෙළඳ හා මලාපවහන ණයගැති ශේෂය වර්ෂ දෙකකට වැඩි කාලයක් හිඟව පැවතුණි.එහි ඇතුළත් පොදු ජල

කරාම (Stand Post ) සහ විසන්ධි කිරීමේ පාරිභෝගික ශේෂ පිළිවෙලින් සියයට 58 කින් හා 33 කින් නියෝජනය විය. පොදු ජල කරාම වලින් හිඟ ශේෂයක් සම්බන්ධයෙන් හඳුනාගත හැකි පාරිභෝගිකයන් නොවීම හේතුවෙන් ඉහත ශේෂය අයකර ගැනීම විගණනයේදී තහවුරු කරගත නොහැකි විය. තවද, සමාලෝචිත වර්ෂය අවසානයට පැවති අනෙකුත් ශේෂ අයකර ගැනීම සඳහා ප්‍රමාණවත් පියවර ගැනීමක්ද නිරීක්ෂණය නොවීය.

(ආ) 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන පරිදි වෙනත් ලැබිය යුතු ශේෂ යටතේ ඇතුළත් අනෙකුත් ණයගැති ශේෂය රු.96,431,125 ක් විය. රු. මිලියන 83 ක් හා රු. මිලියන 11 ක් වූ පිළිවෙලින් කොළඹ මහනගර සභාවෙන් හා ආයෝජන මණ්ඩලයෙන් (BOI) ලැබිය යුතු හිඟ ශේෂයන් කිසිදු එලදායී අයකර ගැනීම් ක්‍රියාමාර්ගයක් ගැනීමෙන් තොරව වර්ෂ 3 කට වැඩි කාලයක් ගිණුම්වල පැවතුණි.

(ඇ) එකතුව රු.11,787,385 ක් වූ චලනය නොවන සේවක ණය ශේෂයන් 2012 දෙසැම්බර් 31 දිනට වර්ෂ 5 කට වැඩි කාලයක් අයකර ගැනීමෙන් තොරව පැවතුණි.

(ඈ) 2012, 2010 හා 2010 ට පෙර හඳුනාගන්නා ලද පිළිවෙලින් කැළණිය, කෑගල්ල හා හම්බන්තොට ප්‍රාදේශීය කාර්යාල ගබඩාවල තොග ඌනතා හේතුවෙන් දරන ලද රු.2,421,893 ක්, රු.581,232 ක් හා රු.17,530 ක් වූ පාඩු වගකිව යුතු පුද්ගලයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) රු.5,302,193 ක් වූ මාර්ගස්ථ තොග (සංකේත 203) නිරවුල් කිරීමට කිසිදු පියවරක් ගැනීමෙන් තොරව එම ගිණුමේ දීර්ඝ කාලයක් පැවතුණි.

(ඊ) රු.36,622,723 ක් වූ මාර්ගස්ථ බඩු (විදේශ - 207) විමර්ශනය කිරීමෙන් තොරව ශේෂපත්‍ර දිනයට මාස 6 කට වැඩි කාලයක් එම ගිණුමේ පැවතුණි. 2014 මැයි අවසානය වන විටත් එම තත්ත්වය නොවෙනස්ව පැවතුණු බවද තවදුරටත් නිරීක්ෂණය විය.

### 1.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 ජනවාරි 01 දිනට පැවති රු.73,610,959 ක් වූ දිගුකාලීන හිඟ මලාපවහන ණයගැති (ගිණුම් අංකය 271/2) ශේෂය 2012 වර්ෂයේදී රු.42,240,924 කින් අඩුකර තිබුණි. එසේ වුවද, ලෙජර් ගිණුම්වල අදාළ සටහන සිදු කිරීම සඳහා වූ ජර්නල් වවුචර් සහ අනෙකුත් අවශ්‍ය ආධාරක ලියකියවිලි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.227,175,000 ක් වටිනා පහත සඳහන් ස්ථාවර වත්කම්වල අයිතිය තහවුරු කර ගැනීම සඳහා ඉඩම් ඔප්පු, අත්පත් කර ගැනීමේ නිවේදන, ගැසට් නිවේදන ආදී විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| විෂයය | පිහිටීම | මුදල |
|---|---|---|
| | | රු. |
| ඉඩම - කොළඹ මහ නගර සභා ප්‍රදේශය | සහකාර සාමාන්‍යාධිකාරී කාර්යාලය, මාලිගාවත්ත | 29,000,000 |
| භූගත ජලාශ ඉඩම් | (අ) නිලාවෙලි | 7,500,000 |
| | (ආ) මහ කොළඹ අප ජලය ව්‍යාපෘතිය | 187,700,000 |
| ගොඩනැගිලි | මහ කොළඹ අප ජලය ව්‍යාපෘතිය | 2,975,000 |
| එකතුව | | 227,175,000 |

(ඇ) යළි අයකරගත හැකි වැඩ (Rechargeable works) ඉතා කෙටි කාල පරිච්ඡේදයක් තුළ බොහෝ අවස්ථාවලදී වර්ෂයකට අඩු කාලයක් තුළ නිම කළ හැකි කාර්යයන් වේ. කෙසේ වුවද 2012 දෙසැම්බර් 31 දිනට වර්ෂ 3 කට වැඩි කාලයකට පෙර භාරගන්නා ලද යළි අයකරගත හැකි වැඩ 50 ක් සම්බන්ධයෙන් පාරිභෝගිකයන්ගෙන් ලබාගන්නා ලද එකතුව රු.87,271,439 ක් වූ අත්තිකාරම් මූල්‍ය ප්‍රකාශනවල ගෙවිය යුතු ශේෂ ලෙස දක්වා තිබුණි. **එම වැඩ පිළිබඳ එක් එක් කාර්ය සම්බන්ධයෙන් 2012 දෙසැම්බර් 31 දිනට ප්‍රගති වාර්තා සහ ප්‍රමාදයන් සඳහා හේතු ආදී විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.**

(ඈ) කිසිදු විස්තරයක් නොමැතිව 2012 දෙසැම්බර් 31 දිනට ත්‍රිකුණාමලය ප්‍රාදේශීය කාර්යාලයේ රු.6,042,111 ක් වූ චලනය නොවන යළි අයකරගත හැකි වැඩ ලැබිය යුතු ශේෂයක් නිරීක්ෂණය වූ අතර, කිසිදු විමර්ශනයකින් තොරව වර්ෂ 3 කට වැඩි කාලයක් එය වර්ෂයෙන් වර්ෂය ලෙජර් ගිණුම්වල ඉදිරියට ගෙනැවිත් තිබුණි.

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දුන් පරිදි, පොත් අගය රු.8,663,620,800 ක් වූ දේපල, පිරියත හා උපකරණ විමර්ශනය කිරීමකින් තොරව මූල්‍ය ප්‍රකාශනවල අඛණ්ඩව දක්වා තිබුණද, 2010 වර්ෂයේ සිට භෞතික සත්‍යාපනයකට ඉදිරිපත් කර නොතිබුණි.

ඒවායින් රු.2,037,405,374 ක් වටිනා වත්කම් ද්වීගණනයක් ලෙස හඳුනා ගෙන තිබූ අතර 2012 වර්ෂයේ ගිණුම්වල ගලපා තිබුණි. එහෙත් ද්වීගණනය නිවැරදි කිරීම සඳහා කරන ලද ජර්නල් සටහන ඇතුළත් ද්වීගණනය පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. තවද, 2012 දෙසැම්බර් 31 දිනට වටිනාකම රු.6,626,215,426 ක් වූ ඉතිරි වත්කම් පිළිබඳ පැවැත්මද විගණනයට තහවුරු කර නොතිබුණි.

(ඊ) 2012 වර්ෂයේදී රු.107,794,723 ක් හා රු.18,858,109 ක් වූ පිළිවෙලින් හඳුනා නොගත් හා නොසැසඳූ දිගුකාලීන හිඟ හර ශේෂයන් හා බැර ශේෂයන් නිරවුල් කිරීමට සිදු කරන ලද සටහන් සම්බන්ධයෙන් ජර්නල් වවුචර් හා අදාළ විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**1.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

---

විගණනයේදී පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

(අ) 2006 සැප්තැම්බර් 22 දිනැති අංක 30 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ දක්වා ඇති පරිදි මණ්ඩලයේ බඳවා ගැනීම් හා උසස් කිරීම් යෝජනා ක්‍රමය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ (MSD) අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ආ) 1997 ජනවාරි 24 දිනැති අංක 116 දරන පීඊඩී චක්‍රලේඛයට පටහැනිව වාහන 57 ක් රේඛීය අමාත්‍යාංශයට හා වෙනත් රජයේ ආයතනවලට මුදාහැර, සමාලෝචිත වර්ෂය සඳහා එම වාහන වෙනුවෙන් වියදම් ලෙස රු. 1,471,427 ක මුදලක් මණ්ඩලය විසින් දරා තිබුණි.
ඊට අමතරව ඉහත චක්‍රලේඛ උපදෙස්වලට පටහැනිව වෙනත් රජයේ ආයතනවලට මුදාහරින ලද සේවකයන් 7 දෙනෙකු සඳහා 2012 වර්ෂය තුළදී මණ්ඩලය විසින් රු.2,462,364 ක් වූ වැටුප් හා වෙනත් දීමනා ගෙවා තිබුණි.

(ඇ) මුදල් රෙගුලාසි 626 ට පටහැනිව, විදේශ මූල්‍යයන ව්‍යාපෘති 34 කින් ව්‍යාපෘති 23 ක් සම්බන්ධයෙන් 2012 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මණ්ඩලයේ වැඩ කටයුතු වලින් වූ ප්‍රතිඵලය, රු.407,019,536 ක බදු පූර්ව ශුද්ධ ලාභයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ බදු පූර්ව ශුද්ධ ලාභය රු.737,409,182 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.330,389,644 ක පිරිහීමක් දැක්වුණි. විවිධ අදියරයන්හි මූල්‍ය ප්‍රතිඵල පිළිබඳ සාරාංශයක් පහත වගුවෙන් දැක්වේ.

| විස්තරය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය | | | |
|---|---|---|---|---|
| | 2012 | 2011 | වෙනස | |
| | රු. | රු. | රු. | % |
| ආදායම | 14,344,205,499 | 12,609,703,240 | 1,734,502,259 | 13.76 |
| විකුණුම් පිරිවැය | (8,821,797,602) | (7,470,490,082) | (1,351,307,520) | 18.09 |
| දළ ලාභය | 5,522,407,897 | 5,139,213,158 | 383,194,739 | 7.46 |
| වෙනත් මෙහෙයුම් ආදායම් හා ලැබීම් | 1,586,511,700 | 1,318,540,370 | 267,971,330 | 20.32 |
| පරිපාලන වියදම් | (5,848,136,492) | (4,680,820,504) | (1,167,315,988) | 24.94 |
| වෙනත් මෙහෙයුම් වියදම් | (54,474,810) | (227,425,798) | (172,950,988) | (76.05) |
| මෙහෙයුම් ලාභය | 1,206,308,295 | 1,549,507,226 | (343,198,932) | (22.15) |

| | | | | |
|---|---|---|---|---|
| මූල්‍ය ආදායම | 213,955,983 | 131,257,102 | 82,698,882 | 63.01 |
| මූල්‍ය පිරිවැය | (1,013,244,742) | (943,355,146) | (69,889,595) | 7.41 |
| බදු පූර්ව ලාභය | 407,019,536 | 737,409,182 | (330,389,644) | (44.80) |
| බදු | (40,217,024) | (53,055,544) | 12,838,520 | (24.20) |
| වර්ෂය සඳහා ලාභය | 366,802,512 | 684,353,637 | (317,551,125) | (46.40) |

ඒ අනුව මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉහත විශ්ලේෂණය කර ඇති පරිදි, ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ ශුද්ධ ලාභය පිරිහීමට ප්‍රධාන හේතුව රු.1,167,315,988 කින් පරිපාලන වියදම් වැඩිවීමයි. තවද, සමාලෝචිත වර්ෂය තුළ කරන ලද වැටුප් සංශෝධනය පරිපාලන වියදම් වැඩිවීමට හේතු වී තිබුණි.

(ආ) 2011 වර්ෂයේදී රු.560,437 ක් වූ එක් සේවකයෙකුට දායකය 2012 වර්ෂයේදී සියයට 19 කින් වැඩි වී තිබුණු අතර 2011 වර්ෂයේදී එක් සේවකයෙකුට රු.74,629 ක් වූ ශුද්ධ ලාභය 2012 වර්ෂයේදී සියයට 49 ක අඩුවීමක් නිරූපණය කරමින් රු.37,392 දක්වා අඩු වී තිබුණි.

(ඇ) ජල සම්පාදන ව්‍යාපෘති සඳහා ලබාගත් විදේශ ණය මත පොලී ලෙස ජල නිෂ්පාදන එක් ඒකකයක් සඳහා රු.4.90 ක් මණ්ඩලයට දැරීමට සිදුවී තිබුණු අතර එය එක් ඒකකයකට මුළු නිෂ්පාදන පිරිවැයෙන් සියයට 13 ක් විය. අනාගතයේදී ගෙවිය යුතු විදේශ ණය විශ්ලේෂණය කිරීමේදී ඉදිරි වර්ෂවලදී මෙම රේටය තවදුරටත් වැඩිවන බව පෙන්නුම් කෙරේ.

## 2.2 මෙහෙයුම් සමාලෝචනය
-----------------------------

### 2.2.1 පිරිසිදු ජලය නිෂ්පාදනය හා බෙදාහැරීම
-----------------------------------------

2012 වර්ෂය තුළදී මණ්ඩලය විසින් පිරිසිදු ජලය ඝන අඩි මිලියන 525.6 ක් නිෂ්පාදනය කර තිබුණු අතර එය 2011 වර්ෂයේ නිෂ්පාදනයට සාපේක්ෂව සියයට 7.26 ක වැඩිවීමක් පෙන්නුම් කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානය වන විට දෙන ලද ජල සැපයුම්

සම්බන්ධතා සංඛ්‍යාව 1,585,018 ක් වූ අතර එය පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 9.5 ක වැඩිවීමක් පෙන්නුම් කෙරුණි.

### 2.2.2 ආදායම් නොලබන ජලය (NRW)

ආදායම් නොලබන ජලය හේතුවෙන් මණ්ඩලය විසින් දරන ලද පාඩුව වෙනම හඳුනා ගෙන ගිණුම්ගත නොකරන ලද නමුත් සාමාන්‍ය පිරිවැය ලෙස ගිණුම්ගත කර තිබුණි. සමාලෝචිත වර්ෂය හා පෙර වර්ෂ 4 ක් සඳහා ආදායම් නොලබන ජලය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| විස්තරය | 2012 | 2011 | 2010 | 2009 | 2008 |
|---|---|---|---|---|---|
| ජලය නිෂ්පාදනය (ඝන මීටර්) | 525.6 | 490.0 | 469.0 | 449.0 | 440.2 |
| ජලය පරිභෝජනය (ඝන මීටර්) | 368.5 | 344.5 | 321.5 | 309.2 | 300.9 |
| ආදායම් නොලබන ජලය (ඝන මීටර්) | 157.1 | 145.5 | 147.5 | 139.8 | 139.3 |
| ජලය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස ආදායම් නොලබන ජලය | 29.89 | 24.64 | 31.45 | 31.14 | 31.65 |

ඒ අනුව මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 වර්ෂයේදී මණ්ඩලය විසින් නිෂ්පාදනය කරන ලද ජල ප්‍රමාණයෙන් ජල කාන්දු වීම්, නීත්‍යානුකූල නොවන ජල සම්බන්ධයන්, ගාස්තු නිදහස් සැපයුම් හා පරිපාලන ආදී හේතූන් මත ආදායම් නොලබන ජලය සියයට 30 කින් නියෝජනය වේ. 2012 වර්ෂයේදී කොළඹ නගරයේ ආදායම් නොලබන ජලය කොටස සියයට 49 ක් විය. මෙම තත්ත්වය පාලනය කිරීමට නොහැකි වීම හේතුවෙන්,2012 වර්ෂයේදී පරිභෝජනය කරන ලද ජලය එක් ඒකකයකට රු.7.15 ක අතිරේක පිරිවැයක් මණ්ඩලයට දැරීමට සිදු වී තිබුණු බව නිරීක්ෂණය විය. එය එක් ඒකකයක් නිෂ්පාදනය කිරීමේ පිරිවැයෙන් සියයට 43 කින් නියෝජනය වේ.

(ආ) නීත්‍යානුකූල නොවන ජල සම්බන්ධයන් අඩු කිරීමට හා ජලය බෙදාහැරීම් ප්‍රධාන නලවල තාවකාලික කඩාවැටීම් සඳහා අලුත්වැඩියා කිරීමේ ක්‍රම වේගවත් කිරීම සඳහා පසුගිය කාල පරිච්ඡේදය තුළ මණ්ඩලය විසින් ක්‍රියාමාර්ග ගෙන තිබුණද, ඉකුත් වර්ෂයට සාපේක්ෂව ආදායම් නොලබන ජලය අනුපාතය අඩු වී නොතිබුණි.

(ඇ) වර්ෂ 75 කට වඩා පැරණි වූ කොළඹ නගරයේ ප්‍රධාන ජල බෙදාහැරීම් පද්ධතිය නවීකරණය සඳහා අවශ්‍යතාවයක් තිබීම හේතුවෙන් එම කාරණය සඳහා සැලසුම්

පිළියෙල කිරීම හා ක්‍රියාත්මක කිරීමේ හදිසි අවශ්‍යතාවය සඳහා මණ්ඩලය විසින් විශේෂ අවධානය යොමු කෙරේ. දැනට මේ සම්බන්ධයෙන් විදේශ මූල්‍යයන ව්‍යාපෘති 2 ක් ක්‍රියාත්මක වෙමින් තිබුණද, එයින් ප්‍රධාන ජල නල සඳහා ප්‍රමාණවත් ප්‍රතිසංස්කරණයක් සිදු කර ගෙන නොතිබුණි.

ජල නල කාන්දු වීම් හේතුවෙන් ආදේශ කළ යුතු ප්‍රධාන ජලය බෙදාහැරීම් නල මේ දක්වා නිශ්චිතව හඳුනාගෙන නොතිබුණි. ප්‍රධාන ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාත්මක කිරීම සඳහා යෝජනා සිදු කර තිබුණද, ඒවායේ ක්‍රියාත්මක වීම ඉතා අඩු මට්ටමක විය.

(ඈ) කොළඹ නගරය හැර අනෙකුත් ප්‍රදේශවල ආදායම් නොලබන ජලය අඩු කර ගැනීම සඳහා මණ්ඩලයේ අවධානයද ප්‍රමාණවත් නොවූ අතර, සංයුක්ත සැලැස්මේ ඇතුළත් කරන ලද ඉලක්ක තාත්වික නොවන බවද නිරීක්ෂණය විය.

### 2.2.3 මලාපවහන පද්ධතිය

----------------------

රටේ ආර්ථික සංවර්ධනය සමඟ නාගරීකරණය ඇතිවීම හේතුවෙන් නගරවල මලාපවහනය අපහරණය සඳහා යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම් සිදුකිරීමේ අවශ්‍යතාවය පැන නැගී ඇත. එම පහසුකම් සැපයීම මණ්ඩලයේ වගකීම වුවද, මෙම ක්ෂේත්‍රයේ ප්‍රමාණවත් ප්‍රගතියක් මෑත වර්ෂවලදී දක්නට නොතිබුණි. ජාතික ප්‍රතිපත්තියක් වශයෙන් ජනගහනයෙන් සියයට 7 කට මලාපවහන අපහරණය කිරීමේ පහසුකම් සැපයීම අපේක්ෂා කර තිබුණද, එහි ඉටුකර ගැනීම පරීක්ෂා කිරීම සඳහා තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

මණ්ඩලයේ සභාපති විසින් මේ සම්බන්ධයෙන් පහත පරිදි සඳහන් කර තිබුණි.

එම ව්‍යාපෘති සඳහා ප්‍රදානිත ආයතන විස අනුග්‍රාහකයකු හඳුනා නොගැනීම හේතුවෙන් අපජලය යෝජනා ක්‍රම සංඛ්‍යාව සීමාසහිත වීමෙන් ජාතික ප්‍රතිපත්තියක් ලෙස ජනගහනය සියයට 7 ක් සඳහා බලාපවහන අපහරනය කිරීමේ පහසුකම් ආවරණය කිරීම ඉටුකර ගත නොහැකි වී තිබුණි.

### 2.2.4 විදේශ මූල්‍යයන ව්‍යාපෘති

දේශීය හා විදේශීය අරමුදල් යොදා ගනිමින් ජල සම්පාදන හා සනීපාරක්ෂක සේවා සඳහා මණ්ඩලය විසින් ව්‍යාපෘති විශාල සංඛ්‍යාවක් සිදු කරමින් තිබෙන අතර මේ සම්බන්ධයෙන් පහත සඳහන් දුර්වතාවයන් නිරීක්ෂණය විය.

(අ) විශාල පරිමාණයේ විදේශ මූල්‍යයන ව්‍යාපෘති බොහෝ ප්‍රමාණයක් නියමිත දිනට සම්පූර්ණ කර නොතිබූ අතර, ව්‍යාපෘති කාල පරිච්ඡේදය දීර්ඝ කිරීම් නිසා අතිරේක වැඩ හා මිල ඉහළ යාම් හේතුවෙන් පිරිවැය විශාල ලෙස වැඩි වී තිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම සඳහා ඒකාකාරී ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුගමනය කර නොතිබුණි.

### 2.3 මූල්‍ය කළමනාකරණය

ජල සම්පාදන යෝජනා ක්‍රම සඳහා 2012 දෙසැම්බර් 31 දිනට මණ්ඩලය විසින් මහා භාණ්ඩාගාරය මගින් ලබාගන්නා ලද මුළු විදේශීය ණය ශේෂය රු. මිලියන 32,574 ක් හෙවත් මුළු වත්කම් වලින් සියයට 14.69 ක් විය. පහත විශ්ලේෂණය කර ඇති පරිදි, 2012 දෙසැම්බර් 31 දිනට හිඟ ණය වාරික රු. මිලියන 5,356 ක් වූ අතර, ඒ අනුව ප්‍රමාදය සඳහා ගෙවන ලද අතිරේක පොලිය රු.මිලියන 149 ක් විය.

| වර්ෂය | හිඟ වාරික | | | නියමිත දිනට පොලිය නොගෙවීම හේතුවෙන් ගෙවන ලද අතිරේක පොලිය |
|---|---|---|---|---|
| | ප්‍රාග්ධන ගෙවීම | පොලිය | එකතුව | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| 2012 | 990 | 1,732 | 2,722 | - |
| 2011 | 957 | 1,036 | 1,993 | 57 |
| 2010 | 587 | - | 587 | 82 |
| 2008 | 54 | - | 54 | 10 |
| එකතුව | 2,588 | 2,768 | 5,356 | 149 |

**3. හඳුනාගන්නා ලද පාඩු**

-----------------------

2009 වර්ෂය සඳහා රටේ ජාතික අයවැය මගින් යෝජනා කරන ලද පරිදි මාසිකව ඒකක 15 ට වඩා අඩුවෙන් පරිභෝජනය කරන පාරිභෝගිකයන් රු.20 ක වට්ටමකට හිමිකම් ලබයි. රජය විසින් එම තීරණය එම වර්ෂයට පමණක් ක්‍රියාත්මක කර, එයින් පසුව එම කාර්යය සඳහා අරමුදල් වෙන්කර නොතිබුණු නමුත්, අරමුදල් සපයා ගැනීමේ ක්‍රියාමාර්ගයක් නොමැතිව මණ්ඩලය විසින් 2012 ඔක්තෝබර් දක්වා එම සහනය ලබා දී තිබුණි. ඒ අනුව, එම ගනුදෙනුවෙන් 2012 දෙසැම්බර් 31 දක්වා මණ්ඩලයට සිදු වූ මුළු පාඩුව රු. මිලියන 417.33 ක් වූ අතර වර්ෂ අනුව විශ්ලේෂණයක් පහත දැක්වේ.

| වර්ෂය | පාඩුව |
|---|---|
| | රු. මිලියන |
| 2012 | 118.61 |
| 2011 | 159.78 |
| 2010 | 138.94 |
| | --------- |
| එකතුව | 417.33 |
| | ====== |

**4. අයවැය පාලනය**

------------------

සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ගත සහ තථ්‍ය ආදායම හා වියදම අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 5. පද්ධති හා පාලන

------------------

පද්ධති හා පාලන පිළිබඳව නිරීක්ෂණය වූ දුර්වලතා මණ්ඩලයේ සභාපතිගේ අවධානයට වරින්වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

(අ) පාලන ගිණුම් සැසඳීම

(ආ) වත්කම් කළමනාකරණය

(ඇ) තොග පාලනය

(ඈ) ගිණුම්කරණය

(ඉ) ව්‍යාපෘති පරිපාලනය හා කාර්ය සාධන සමාලෝචනය

(ඊ) ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ